විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක : 04/2017

මගේ අංකය : විවැ/චක්‍රලේඛ/04/2017
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
කොළඹ 10
2017.10.20

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ත්‍රිවිධ හමුදාධිපතිවරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,
පළාත් පාලන ආයතන ප්‍රධානීන්.

**වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයන් සඳහා පැරණි අංක :82/83 හා M/F,TWP, පිරිවෙන්, පෞද්ගලික පාසල් හා පළාත් පාලන කාණ්ඩ යටතේ ලියාපදිංචි පැරණි සාමාජිකයින් මාර්ගගත ක්‍රමය (Online) ඔස්සේ නැවත ලියාපදිංචි කිරීම.(Re- Registration)**

ඉහත කරුණ සම්බන්ධයෙන් 2017.10.12 දිනැතිව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 26/2017 කෙරෙහි ඔබේ අවධානය යොමු කරමි.

02. වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දැනටමත් පොදු **86**, පොදු **86 (අ)**, **PD 01- 02,TWP 1, LGS 8** හා **PD 01A - 02A** අයදුම්පත් භාවිතා කරමින් **82/83, M/F, TWP**, පිරිවෙන්, පෞද්ගලික පාසල් හා පළාත් පාලන කාණ්ඩ යටතේ, **2016.01.01** දිනට පෙර ලියාපදිංචි වූ පැරණි සාමාජිකයන් නැවත මාර්ගගත ක්‍රමය ඔස්සේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි නැවත ලියාපදිංචිවීම අනිවාර්යය වේ.

03. 2015.04.07 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක : 02/2015 අනුව මාර්ගගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි නොවූ දැනට සේවයේ නියුතුව සිටින සියළුම රාජ්‍ය නිලධාරීන් **2018.03.31** දිනට පෙර ලියාපදිංචි විය යුතු වන අතර ඒ සඳහා **www.pensions.gov.lk**යන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් නැවත ලියාපදිංචි පිවිසුම වෙත පිවිස ඇමුණුම 01 හි සඳහන් උපදෙස් පරිදි වැන්දඹු /වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයෙහි කම තොරතුරු ඇතුළත් කිරීම කළ යුතුය.

04. ඇතුළත් කරන ලද තොරතුරු ආයතනයේ පෞද්ගලික ලිපිගොණු පිළිබඳව රාජකාරී කටයුතු කරනු ලබන නිලධාරීන් විසින් තහවුරු කළ යුතුය. ඉහත 02 ඡේදය පරිදි නැවත ලියාපදිංචියේදී වයස අවුරුදු 55 ඉක්මවා ඇති හා විශ්‍රාම ගැන්වීමට ආසන්නව සිටින රාජ්‍ය නිලධාරීන් සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

05. ඒ අනුව ඔබගේ අධීක්ෂණය යටතේ ඇති ආයතන සහ නිළධාරීන් උක්ත 03 ඡේදය අයුරින් විධිමත් පරිදි දැනුවත් කිරීමට කටයුතු කිරීම සුදුසුය.

06. ඉහත ක්‍රමය යටතේ ලියාපදිංචි කිරීමේදී යම් ගැටළුවක් මතු වන්නේ නම්, පහත සඳහන් දුරකථන අංක සහ විද්‍යුත් තැපැල මඟින් විස්තර ලබා ගත හැක.

**පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ තොරතුරු (තොරතුරු තාක්ෂණ අංශය)**

**දුරකථන අංක : 011-5920403 , 011-2320049**

**විද්‍යුත් තැපැල : inquiries.pms@pensions.gov.lk**

**ඒ.ජගත් ඩී.ඩයස්**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :** 1.ජනාධිපති ලේකම් - කරු.දැ.ගැ.ස

2. අග්‍රාමාත්‍ය ලේකම් - එම

3. ලේකම්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය - එම

4. විගණකාධිපති - එම